

## ඔස්ට්‍රේලියා ශ්‍රී ලංකා කෙයාරර්ස් ඇසෝසියේෂන් ඉදිරිපත් කරන

# සුරක්නා

ප්‍රවීණ රංග ශිල්පි චිත්‍රපට අධ්‍යක්ෂ මාධ්‍යවේදී ගත් කතුවර ජැක්සන් ඇන්තනි කලාශිල්පියා මෙල්බන් ප්‍රසංග වේදිකාවේ පෙරළියක් කරමින් තම බිරිඳ වන ප්‍රවීණ රංගන හා ගායන ශිල්පි කුමාරි මුණසිංහත් සූරිය අරණ සිනමා පටයෙන් සිනමාවට සම්ප්‍රාප්ත වී අබා සිනමා පටයෙන් අපේ සිත්වල නොමැකෙන සටහනක් තැබූ සජිත අන්ත්තර පුතාත් හපන් පැදුරෙන් හපන් කම් පෑ මාධවී සියණියත් අබිල පුතාත් සමගින් ඔබ හමුවට පැමිණෙන "සුරක්නා" දැවැන්ත ප්‍රසංගය ප්‍රසංගය ජූනි 12 වනදා කෙල් වොට්සන් රඟහලේදී සවස 6ට රංග ගත කිරීමට සියලු කටයුතු දැන් සූදානම්ව ඇත . මේ පිළිබඳව ප්‍රසංගයේ සංවිධායක මණ්ඩලය සමග කළ සංවාදයකි මේ.

ශ්‍රීනාත් මද්දුමගේ

**මේ ප්‍රසංගය පෙළ ගස්වා තියෙන්නෙ මොන ආකාරයට ද?**

මේ ප්‍රසංගය කුඩා දරුවාගේ සිට වැඩිහිටි සැමටම එක සේ රස විඳිය හැකි මෙයට පෙර කිසි දිනෙක නොදුටු ආකාරයේ ප්‍රසංගයක් ලෙස සංවිධානය කිරීමයි අපේ අරමුණ. හපන් පැදුරෙන් ඔබේ දරුවන් ඇසූ ළඟ ගීත වල සිට වේදිකා නාට්‍ය ගීත ජනප්‍රිය පැරණි ගීත සහ නව නිර්මාණ රැසක් ඉදිරිපත් වෙනවා. නැටුම් ගැයුම් වැයුම් වලින් පිරි "සුරක්නා" ප්‍රසංගය ජැක්සන් ඇන්තනි නම් වන අති දක්ෂ කලාශිල්පියාගේ තවත් නව පියවරක් ලෙස හඳුන්වන්න කැමතියි.

**මේ ප්‍රසංගය සංවිධානය කිරීමේ අදහස ඇති වුණේ කොහොමද?**

අපි වසරක් පාසා මෙවැනි ප්‍රසංග පවත්වනවා. ගිය වසරේදී අපි එඩ්වඩ් ජයකඩේ චරිතා ප්‍රියදර්ශණී සහ ඔවුන්ගේ දරු දෙදෙනා සමග ප්‍රසංගයක් පැවැත්තුවා. එය ඉතාමත් සාර්ථක වුණා. මෙල්බන් පුරවරයේ ප්‍රථම වතාවට තමයි එවැනි ප්‍රසංගයක් පැවැත්තුවේ. ඒ ප්‍රසංගයෙන් පස්සෙ අපට හුඟක් දෙනෙක් කිව්වා මෙවැනිම ප්‍රසංග ඉදිරියේදීත් පවත්වන්න කියලා. එම ඉල්ලීම අනුව තමයි මේ ප්‍රවීණයන්ට අප මේ වතාවේ ආරාධනා කළේ.

**සුරක්නා සංගය කිරීමේ අරමුණ පැහැදිළි කරන්න පුලුවන්ද?**

අපේ මූලික අරමුණ තමයි දැනට අප විසින් ආධාර උපකාර කරනු ලබන ශ්‍රී ලංකාවේ වෙසෙනෙ ළමුන්ගේ ආධාර වැඩ පිළිවෙලට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම. මෙයින් ලැබෙන සියලුම ආදායම මේ ළමුන් සඳහා වෙන් වෙනවා.

**මේ පිළිබඳව තව විස්තර කරන්න පුලුවන්ද?**

අප මේ සංගමය ආරම්භ කළේ 2005 වසරේ. මෙය ආරම්භ කරන්න මූලික හේතුව වුණේ ලංකාවට ඇති වූ සුනාමි ව්‍යසනය. අපි හතුවා සුනාමි ව්‍යසනයෙන් අනාථ වූ දරුවන්ට උපකාරයක් කරන්න හැකි වැඩ පිළිවෙලක් සකස් කරන්න. ඒ අනුව අපි ළමුන් තිස් දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා මාස්පතා ආධාර මුදලක් යවනවා. හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්ක වලින් තමයි අපි මේ ළමයින් තෝරා ගත්තේ. ඉතා අසරණ තත්වයේ ඉනාන මේ දරුවන් වෙනුවෙන් කරන මේ සේවාව දිගටම පවත්වාගෙන යාමට ඔබ සැමගේ සහයෝගය ලබා ගැනීම තමයි මේ ප්‍රසංගයේ අරමුණ. මේ සත් කාර්යය වෙනුවෙන් ඔබ සියලු දෙනාම අප සමග එක් වේ යයි අපි බලාපොරොත්තු වෙනවා.

අපි හැම අවුරුද්දකම ලංකාවට ගොස් මේ දරුවන් කොළඹට ගෙන්නා ඔවුනට පොත් පත් සහ වෙනත් තෑගි බෝග දී ඔවුන් සතුටු කරනවා. මේ වසරේදී අපි බලාපොරොත්තු වෙනවා ඔවුන් වෙසෙන ප්‍රදේශවලටම ගොස් ඔවුන් මුණ ගැසෙන්න. මේ ගමනට සහභාගි වෙන්නත් උදව් උපකාර කරන්නත් ඔබටත් අපි ආරාධනා කරනවා. මේ බොහෝ දරුවන්ගේ එක්කෝ මව මිය ගිහින් නැත්නම් පියා මිය ගිහින්. එහෙමත් නැත්නම් ඒ දෙදෙනාම නැහැ. ඔවුන් භාරකාරයන් ළඟ තමයි හැදෙන්නෙ.

**ඔබේ විස්තරයෙන් අපට හැඟී යනවා මේ ප්‍රසංගය පැවැත්වීම පිටුපස තියෙන උදාර අරමුණ. මේ ප්‍රසංගයට අපේ ප්‍රජාවේ සහභාගිත්වය කොහොමද?**

සුරක්නා පදනමේ දෙමාපියන්ගේ දරු දැරියන් හා මෙහි සිටින නැටුම් ගැයුම් වැයුම් වලට දක්ෂ ළමුන් ජැක්සන් ඇන්තනි ප්‍රමුණ ප්‍රවීණ ශිල්පීන් සමග ගායනයෙන් රංගනයෙන් සහබාගි වෙනවා. ඒ වගේම මෙම ප්‍රසංගයේ සංගීතය සපයන්නේ මෙල්බන් නුවර ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන රොෂාන් ලින්තොටගේ ප්‍රමුඛ බී ෂාප් සංගීත කණ්ඩායමයි.

සුරක්නා පදනම වසර පහක් තිස්සේ කරගෙන යනු ලබන මේ සත් කාර්යයේ වැදගත් කම ඔබටත් වටහෙනවා ඇති. ශ්‍රී ලංකාවේ දුගී දුප්පත් දරු දැරියන් වෙනුවෙන් කැපවීමෙන් යමක් කරන මේ පදනමේ සාමාජිකයන් ට අපේ සමාජයේ ප්‍රශංසාව හිමිවිය යුතුයි. යමක් කළ හැකි බොහෝ අය නිහඬව සිටියදී තමන්ගේ සම්පත් වැය කරමින් ඔවුන් මේ කරගෙන යන්නේ ඉතා අපහසු කාර්යයක් බව පැහැදිළියි. මේ ප්‍රසංගය නරඹීමෙන් ඔබටත් මේ බැරෑරුම් සහ වැදගත් සේවයට සම්මාදම් වන්නට හැකිවෙයි. ප්‍රසංගයේ ප්‍රවේශපත්‍රයක් ගැනීම ප්‍රසංගයන් නැරඹා සතුටු වීමේ අවස්ථාවෙන් නොනැවතී ඉතා වටිනා සත් කාර්යයකට සම්මාදම් වීමේ වරයද ඔබටද හිමි කර දෙයි.

අති දක්ෂ කලා ශිල්පියකු වන ජැක්සන් ඇත්තනි සහ පවුලේ සාමාජිකයන් එකම වේදිකාවක් මත සිට අප සියලු දෙනාම රස ගැන්වීමත් කිසි දිනෙක මග හැර ගත යුතු නැති අපූරු සිදුවීමක් නොවන්නේද?

වැඩි විස්තර සඳහා සවස 6.30 න් පසු ශිරෝමා ප්‍රනාන්දු 9794 0407 හෝ කමණි හබරකඩ 9702 5828 අමතන්න.

## කුඩාගල කෝවිද හිමියන් ලියූ

# "යථාර්ථය" කාව්‍ය සංග්‍රහය

රසික සූරියආරච්චි

පසුගිය වසරේ මැයි මස මෙල්බර්න් හි දී පවත්වන්නට දෙයුණු ජගත් ජේ. එදිරිසිංහ ගේ පොත් එළි දැක්වීමේ උළෙලේ දී කෙටියෙන් කතාවක් කළ ඕස්ට්‍රේලියානු සිංහල මහා ලේඛක ඩී.බී. කුරුප්පු, මෙල්බර්න් නගරයට මුලින් ම සංක්‍රමණය කර වසර හයක් එහි වාසය කළ ද, දැන් වසර දහයක පමණ කාලයක් තිස්සේ සිඩ්නි නුවර තම වාසභූමිය කරගෙන සිටින මගේ සිත කුල්මත් වෙන ආකාරයේ සඳහනක් කලේය. එනම්, ඕස්ට්‍රේලියාව ඇතුලත සමස්ත සිංහල සංස්කෘතියේ වැඩි සාන්ද්‍රණය සහිත කේන්ද්‍රස්ථානය මෙල්බර්න් නුවර වූව ද, සංඛ්‍යාව අතින් වැඩිවශයෙන් ලේඛකයින් සිටින්නේ සිඩ්නි නුවර බවයි.

ඩී.බී. කුරුප්පු තමන් ලියූ ලිපියක ද මේ පිළිබඳව සඳහන් කර තිබූ බව මගේ මතකයයි. පසුගිය දිනවල සන්නසේ පලවූ සිනුවර හසුන නම් තීරු ලිපියේ ද සිඩ්නි වාසී ලේඛකයින් පිළිබඳ විස්තර විටින් විට දක්නට ලැබුණි.

සිඩ්නි නුවර සිටින ප්‍රභන්ධ, කාව්‍ය හෝ ශාස්ත්‍රීය ග්‍රන්ථ පලකර ඇති ලේඛකයින් ගැන කතා කෙරෙන විට, මට සිතෙන අයුරින් එක්තරා සුවිශේෂී හේතුවක් නිසා දෝ, සාමාන්‍යයෙන් ගිලිහී යන එක් නමක් වේ. ඒ කුඩාගල කෝවිද යන්නයි.

පූජ්‍ය කුඩාගල කෝවිද යනු සිඩ්නි නුවරින් කිලෝ මීටර් සියයක් පමණ බටහිරින් පිහිටි නීල කඳුවැටිය ආශ්‍රිත කටුම්බා නම් වූ ග්‍රාමයේ ස්ථාපිත ඕස්ට්‍රේලියානු බෞද්ධ විහාරයේ වැඩ වසන ශ්‍රී ලාංකික බෞද්ධ භික්‍ෂුන්වහන්සේ ය. ඇල්පිටිය ප්‍රදේශයේ උපත ලබා, ලංකාවේ පිරිවෙනේ අධ්‍යාපනය ලැබූ කුඩාගල කෝවිද හිමියන් පසුව ඉන්දියාවේ කල්කටා විශ්ව විද්‍යාලයෙන් උපාධි ලැබූ උගත්, සිල්වත් තරුණ හිමි නමකි. උන්වහන්සේ දැන් දශකයකටත් වඩා වැඩි කාලයක සිට ඉහත කටුම්බා විහාරස්ථානයේ වැඩ වෙසෙමින් ඕස්ට්‍රේලියානු බෞද්ධ ප්‍රජාවට සලසන්නේ අපමණ සේවයකි.




කුඩාගල කෝවිද හිමියන් විසින් රචනා කර ඇති ග්‍රන්ථ ප්‍රමාණය අති විශාලය. ඒ අතර සිංහලෙන් රචිත පොත් විසි පහක් (25) පමණ ද, ඒවායින් කිහිපයක වෙනත් අය කරන ලද ඉංගිරිසි පරිවර්තන ද ඇතුළුව ඉංගිරිසි පොත් දහයකට වඩා ද වෙයි. ඒ සැමෙකක්ම පාහේ උපදේශණාත්මක සහ වන්දනා ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ සහ බව මෙහි ලා සඳහන් කළ යුතුය. මීට අමතරව, බෞද්ධ චරිතය සහ භාවනාව අළලා කරන ලද දේශනා මෙන්ම, පිරිත් සහ ගාථා වන්දනා ඇතුලත් කර උන් වහන්සේ විසින් සකසා එළිදක්වන ලද සංගත තැටි ප්‍රමාණය ද දහ අටක් පමණ වේ.

මෙතරම් පොත් පත් ප්‍රමාණයට කතෘත්වය දැරුවද, සිඩ්නි ලේඛකයින් ගැන සඳහන් කෙරෙන විට කුඩාගල කෝවිද හිමියන් ගේ නාමය සාමාන්‍යයෙන් නොකියවෙන බව මම මුලින් පැවසූයෙමි. එයට හේතුව ලෙස මා දකින්නේ පොත් ලියා පලකළ සිඩ්නි ලේඛක ගිහි පුද්ගලයින් අතර උන්වහන්සේ පැවිද්දෙක් වීම නොව, කෝවිද හිමියන් ගේ ග්‍රන්ථ සැමෙකක්ම පාහේ පින් කැමති බෞද්ධයින් ගේ අර්ථමය පරිත්‍යාග අනුග්‍රහයෙන් පෞද්ගලික මට්ටමෙන් මුද්‍රණය කර නොමිලේ බෙදා හරින ලද කුඩා ප්‍රමාණයේ ප්‍රකාශන මිස, පොදුවේ අනුගමනය කෙරෙන ප්‍රකාශණ ක්‍රියාවලියට බඳුන් වූ වාණිජමය ග්‍රන්ථ නොවීමයි. කුඩාගල කෝවිද හිමියන් විසින් රචිත නවතම ග්‍රන්ථය වන -යථාර්ථය" නම් වූ කෘතිය ප්‍රකාශණයට පෙර අවසාන මොහොතේ කියවා අදහස් ප්‍රකාශ කිරීමටත්, පසුව එහි මුද්‍රිත පිටපත කියවීමටත්, මට නොබෝද අවස්ථාව ලැබුණි.
-යථාර්ථය" කාව්‍ය සංග්‍රහය යනු සමුදුඝෝෂ විරිතෙන් බඳින ලද සරල, සුගම කවි එකසිය නමයකින් සමන්විත කුඩා පොත් පිංචකි.



ප්‍රමාණයෙන් කෙටි වූ කාව්‍යයක් වුවද, අන්තර්ගතය අතින්, යථාර්ථය කෘතියේ වස්තු විෂයය මෙලොව වාසය කරන පෘථග්ජන අපේ ජීවිත පිළිබඳව වරෙක එළිපිටම පෙනෙන්නේ වුවද බොහෝවිට සැඟවී ඇති, යථාර්ථය ම විස්තර කෙරෙමින් පුළුල් පරාසයක් පුරා පැතිණී යයි.
මේ කාව්‍යය රචනා කිරීමට කෝවිද හිමියන් පෙළඹී ඇත්තේ උන් වහන්සේට එක්තරා දයකයෙකු විසින් එවන ලිපියක් බව කියවේ. ලෝක ආර්ථික අර්බුදය හමුවේ තම ආදයම් මාර්ග ඇහිරී ගොස් දුකට පත් වූ මොහොතේදී මේ පුද්ගලයා නිරීක්‍ෂණය කර ඇත්තේ අප සැම දෙන හොඳින් අසා ඇති ලෝක ධර්මයකි. එනම් තම ආර්ථික අවගමනය සමගම තමන් වටා රොක් වී සිටි නෑදෑ මිතුරන් රැසද තමන් වෙතින් දුරස්වෙන බවයි. මේ මත පදනම් වී කෝවිද හිමියන් අතින් රචනා වුණු යථාර්ථය කෘතිය මේ සත්‍යය වඩාත් තීව්‍ර ලෙසින් අප හමුවේ විස්තරාත්මකව මවා පෙන්වන බව පෙනේ.

කෝවිද හිමියෝ ලොව පවතින කටුක යථාර්ථය ඉතා සරලව මෙලෙස අපට පවසති.
සිටියත් එකට බොහො කල් වී එක ලඟට
හඳුණාගන්න බැහැ මිනිසා මිනිසාට
පෙණුනත් දුරට එක විට ඔහු ලස්සනට
දැකගත නොහැක අදහස් ඇති හිතේ යට
මේ ලෝකයේ කටුක යථාර්ථය පෙන්වන කවි අතරට, කෝවිද හිමියෝ සරල අවවාදයෙන් පිරි කවි කිහිපයක් හෝ ඇතුලත් කර ඇති නිසා, එමගින් අපට යම් ආකාරයක හරි මග පෙන්වීමක් ද සිදුවෙන බව කිව යුතුය.
"යථාර්ථය" කෘතියෙන් අපට මෙලෙස අවවාද ලැබෙයි.

මිනිසා මිනිසාට ඇත අද එරෙහි වෙලා
ඇයි ඔබ ඉන්නේ මිනිසත් කම ඉවත හෙලා
දැන්වත් අනේ මිනිසුනි දුර දිග බලලා
ඉවතට ලන්න සිත තුල ඇති අඳුරු වලා
මීට දශකයකටත් ඉහත කාලයක මා මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ සිටි අවධියේ දී රවී කොග්ගලගේ විසින් මෙහෙයවන ලද භාවනා වැඩ සටහනකට සහභාගී වෙන්නට අවස්ථාව ලැබුණි. එද රවී අපට කියා දුන්නේ පිළිකුල් භාවනාවයි. සිරුරේ ඇති කොටස් එකිනෙක පිළිබඳව යථාර්ථවාදීව සිතමින් ඒ ගැන ඇතිවෙන පිළිකුල මත පදනම් කරගෙන සිත එක්තැන් කරන්නට අප උපදෙස් ලැබුවෙමු.

කෝවිද හිමියන් ගේ මේ "යථාර්ථය" කෘතියේ එන කවි ගායනා කිරීමෙන් ද අපට ජීවිතය සහ අප වෙසෙන සමාජය පිළිබද පෙර කී ආකාරයේ පිළිකුල් භාවනාවක නිරත වී එයින් සිතට ලබා ගත හැකි යම් සහනයක් සුවයක් වේ නම් එය සාක්‍ෂාත් කර ගත හැකි වේ යැයි මම සිතමි.

භික්‍ෂුවක අතින් ලියවෙන මෙවැනි කෘතියක තවත් උපදේශාත්මක අදහස් කවියෙන් ඉදිරිපත් වූයේ නම් වඩා යහපත් යැයි මේ පොත කියවූ දෙවරම මට සිතුණි. ඒ සමගම, යථාර්ථය කෘතියේ කවි අතර දක්නට ලැබෙන පුනරුක්තිය වලක්වා ගත්තේ නම් මේ කෘතියේ සාහිත්‍යමය අගය මීට වඩා වැඩි කරගන්නට බොහෝ ඉඩ තිබෙන බවද පැවසිය යුතුය. කුඩාගල කෝවිද හිමියන් අතින් තව තවත් උපදේශාත්මක ග්‍රන්ථ බිහිවේවා යි අවසාන වශයෙන් පතමි!